

සැප්තැම්බර් 19 වෙනිදට යෙදී තිබුණු ධර්මසිරි ගමගේ සූරීන්ගේ ගුණානුස්මරණය වෙනුවෙනි

# "බුදුබව පතනා පියවරු වෙසෙනාම" ධර්මසිරි ගමගේ..

චන්දන ගුණසේකර
ලන්ඩනයේ සිට

ඒ අසූව දශකයේ අග බාගයයි. රට පුරා පැවති අඳුරු, මූසල භීෂණ සමයෙන් හොඳටම හෙම්බත්ව යන්තම් පණ කෙන්ද බේරා ගත් අප, සරසවි වරම් ලැබීමේ ශාපයෙන්ද බැට කා නන්නත්තාරවී උන් යුගයයි. සරසවියට යාමේ සිහිනය කවදා උදාවේදෝයි දෙගිඩියාවෙන් වුන් අප රැකියා සහ නානාවිධ පාඨමාලා සඳහා පිස්සන් මෙන් අයැදුම් පත් යැවූයේ මේ සමයේයි.

මගේ වාසනාවකට "ඩෙලික්" නමින්වූ ඉංග්‍රීසි පාඨමාලාවක් සඳහා මා තෝරාගෙන තිබිණි. ඒ පාඨමාලාව සැන්ඳෑ යාමයේ, එනම් පාසල් කාලයෙන් පසු අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලයේදී පවත්වනු ලැබුණු අතර නිවෙස්වලටම සිරවී මරණ බයෙන් ගුලිවී වුන් අපට මෙය මහා නිදහස් නිකේතනයක් එහෙමත් නැතිනම් සුන්දරත්වයෙන් පිරි සුයාමයක් මෙන් වූයේ ඒ තරමටම අපේ දිවි පෙවෙත් ඒකාකාරීව එකතැනකම පල් වී තිබූ නිසාවෙනි. දිවයිනේ නන් දෙසින් පැමිණ වුන් සිසුන් මෙහිදී මට හමුවූ අතර ඔවුන් සමඟ ගෙවූ කාලය මගේ දිවියේ ඉතාමත්ම වටිනා සහ අමතක නොවන කාලය බව පැවසිය යුතුමය.

ඉතාමත්ම රසවත්වූ මෙම කාල වකවානුවේ එක් සැන්ඳෑයාමයක වැඩි පත පොතේ වැඩක්ද නොවූයෙන් අපි කල්ලියක් එක්වී සිංදු කීමට පටන් ගතිමු. අඹන්පොළින් පැමිණ සිට තරුණයකු (අවාසනාවකට මට ඔහුගේ නම මතක නැත) මා ඉතාමත්ම ආදරය කළ ලේඩි ඉන් රෙඩ් ගීතය ඉතාමත්ම ළඟන්නා සුළු අයුරින් ගායනා කළේය. ඉතාමත්ම අවාසනාවන්ත ලෙස මෙම පාඨමාලාව අතරතුරදී, පාඨමාලාවට සමුදී යුද හමුදාවට බැඳුණු ඔහු, කොටි ත්‍රස්තවාදින් සමඟ සටනේදී වැදුණු වෙඩි පහරකින් දිවියෙන් සමු ගත්තේ අප හදවත් තුළ කිසිදාක පිරවිය නොහැකි හිඩසක් ඉතිරි කරමිනි.

එදා තවත් එවැනිම රසවත් ගීතයක් පොළොන්නරුවේ සිට පැමිණ වුන් ඉතාමත්ම අහිංසක නිහඬ චරිතයක් වූ ජයන්ත විසින් ගායන කළේ මේ අතරේදීය. ඒ සුන්දර ගීතය මීට පෙර මට ගුවන් විදුලියේ වාදනය වෙනවා අසා තිබුණත් මා එහි හරියටම ගිලී ගියේ ජයන්තගේ ගායනයෙනි. පාසල් කාමරයේ ඩෙස්කුවක් මත වාඩිවී කෙටි තාප්පයට ඔබ්බෙන් වූ පාසල් පිටිය දෙස නෙතු යොමා ධ්‍යානයකට සමවැදී මෙන් එදා ඔහු සුළං කුරැල්ලෝ ගීතය ගැයූ අයුරු මට මේ දැන්ද පෙනෙන්නාක් මෙනි. මා එදා වෙනමම ලොවකට රැගෙන යාමට මේ ගීතය සමත්වූ අතර එදා පටන් එය ගැයූ හරීන් ලන්ත්‍රාටත්, සංගීතය නිර්මාණය කළ කේමදාසයන්ටත් හා ගීතයට මේ අමා දහරාවන් වැනි වදන් දහරාවන් ලියූ ධර්මසිරි ගමගේ සූරීන්ටත් මම පෙම් බඳින්නට පටන් ගතිමි. මෙම ලිපියේ අරමුණ පසුගිය සැප්තැම්බරයේ දහනම වෙනිදාට යෙදුණු ධර්මසිරි ගමගේ සූරීන්ගේ 13 වැනි ගුණානුස්මරණය වෙනුවෙන් බැවින් මම අද එතුමා ගැන පමණක් කතා කරමි.

පසුගිය අගෝස්තුවේ ලංකාවේ ගත කළ කෙටි කාලය තුළදී මරදානට ගොස් පොත් පත් මිලදී ගැනීමට වෙලාවක් කෙසේ හෝ මා වෙන්කර ගත්තේ ඉතාමත්ම අසීරුවෙනි. එහෙත් ඒ ගමන කෙතරම් නම් අගනේ දැයි මට සිතුණේ ගොඩගේ පොත් මැඳුරේදී මා නෙතු ගැටුණු අමිල මැණික් දෙකක් වන් පුංචි පොත් දෙකක් නිසාවෙනි. එකක් නම් බංඩාර කේ විජේතුංගයන්ගේ ගී එකතුව වූ සුළඟ වගේ ඇවිදින් ගී පද මාලා සංග්‍රහයයි. අනෙක නම් මේ ලිපියේ කතා නායකයා වන ධර්මසිරි ගමගේ සූරීන් විසින් විරචිත අමරණීය ගී පදමාලා ඇතුළත් සුළං කුරැල්ලෝ නම් වූ කෘතියයි.

නිවාඩුව නිමවී ලංඩනයට පැමිණ එහි තිබෙන ඒකාකාරීවූත් සහ කාර්යබහුලවූත් වාතාවරණය මැද්දේ ලබා ගන්නා කෙටි හුස්ම පොදකදී මම සුළං කුරැල්ලෝ කියැවීමට අමතක නොකළෙමි. එය මා සැනෙකින්ම හැත්තෑවෙ දශකයේ අග භාගයට රැගෙන යාමට සමත්විය.

ඒ 76 වසර වන්නට ඇත. මෑතකදී අප හැරගිය මගේ ආදරණීය තාත්තා මා කැටුව නැරඹීමට ගිය මුල්ම චිත්‍රපටය වූ හුලවාලී සිනමා පටය ළඟ මගේ අතීතය බලා දිව ගිය සිත නතර විය. එහි අති සංවේදීවූත් උද්වේගීකරවූත් අවස්ථාව වූ සුභා, ධාරාව අතහැරදමා වෙළෙන්දා සමඟ පැන යන අවස්ථාවේ මගේ කුඩා සිත තලා දමමින් මගේ නෙතු කඳුළින් පිරවූ ඒ පසුබිමින් ඇසුණු සුනිල් එදිරිසිංහයන් ගැයූ අමරණීය ගීතය, කුඩා ගමේ මද්දහනේ ලියා තිබුණේද ගමගේ සූරීන්ය. ඉන් පසු අනුරාධපුර සිත්තම්පලම් සිනමා ශාලාවේදී නැරඹූ දුලීකා සිනමා පටයේ මා ඉතාමත්ම ප්‍රිය කළ දුලීකා ගීතය සහ සිකුරුලියා චිත්‍රපටයේ කූටප්‍රාප්තිය වූ සිකුරුලියා බොළඳ ලියා ගීතයද ලියා තිබුණේ එතුමාය.

එමෙන්ම කේමදාසයන් සමඟ එක්ව, කේ ඒ ඩබ්ලිව් පෙරේරා සූරීන්ගේ ප්‍රථම සිනමා පටය වූ සැනසුම කොතනද චිත්‍රපටයට එතුමා තැනූ සුළං කුරුල්ලෝ, සංසාර ගමනේ හා ආදරයේ රන් විමනේ යන ගීත සිංහල සිනමා ගීතයේ හැරවුම් ලක්ෂයක් වූයේ ඒවායේ වූ සංගීතයේ හා පද වල තිබූ නැවුම්බවත් නිර්මාණශීලීබවත් නිසාය. එකල මෙම ගීත, විචාරකයින් මහා ඉහළින් ඇගැයුවේත් වසර පනහකට අධික කාලයක්



කේ.ඒ.ඩබ්. පෙරේරා

ගතවී ඇතත් අදටත් මේ ගීත එදා මෙන්ම රසික හදවත් තුළ ලැගුම් ගෙන ඇත්තේත් මේ නිසාය. මේ ගීත සිනමාපටයක් වෙනුවෙන් ගමගේ සූරීන්ගේ පන්හිඳෙන් ලියැවුණු ප්‍රථම ගී පද රචනා වූ අතර එයින්ම එතුමන් සතුවූ හැකියාව හා ප්‍රතිභාව අපට පෙනී යයි.

ජනක සහ මංජු චිත්‍රපටය උදෙසා ලියූ ලෝකේ ජීවත් වන්නට ලස්සන ඕනෑ වේ හා සුවඳක් දැනේවි හදේහි ආදර ලෝකේ හා හා යන ගීත රසික ප්‍රජාව අතර අති මහත්සේ ජනප්‍රිය විය. එමෙන්ම සුජීවා චිත්‍රපටයට ලියූ චන්දන ඇල්ලෙන් නාලා ගීතය, මනමාලයෝ චිත්‍රපටයට ලියූ නාරද දිසාසේකර ගැයූ ආදර නිල් දෑසේ ගීතය, බිනරමලී චිත්‍රපටය උදෙසා ලියූ රන් පොකුණෙන් දිය නාගෙන එන්නේ ගීතය, රෑන ගිරව් චිත්‍රපටයට ලියූ රෑන ගිරා ජෝඩුවයි හාද වෙලා ආදරෙයි ගීතය , පුංචි බබාල චිත්‍රපටයට ලියූ මාගෙ පුතුට මල් යහන සදන්නේ ගීතය, හන්තානේ කතාව චිත්‍රපටයට ලියූ මහගිරි අරණේ මේ දිවි උයනේ ගීතය, සහනය චිත්‍රපටයට ලියූ සිහින නෙළුම් මල ජීවිත පොකුණේල ගීතය, කවුද හරිල චිත්‍රපටයට ලියූ රිදී කුමාරී සීතල ඇල්ලයි ගීතය හා නිවෙන ගින්න චිත්‍රපටයට ලියූ මා හද වාවනු බෑ ...දරැ සෙනෙහේ ඇතුළු මෙකී නොකී බොහෝ ගීත දනන් තුඩ තුඩ නිතර රැව් දෙන තත්වයට පත්වූයේ ඒවායේ තිබූ අපූර්වත්වයයි. අව්‍යාජ හදවතින්ම ගලා ආ පද මාලාවයි.



ප්‍රේමසිරි කේමදාස

එපමණක්ද? එතුමා තිර රචනය ලියා එතුමන්ම අධ්‍යක්ෂණය කළ පූජා චිත්‍රපටයේ දරු දුක උහුලා තනිව වැලපෙනා ගීතය අසා නොහැඬූ පියකු , පුතකු මේ ලොව ඇතිද? එතරම්ම සංවේදීව හදගැබටම අමතන පියකු ගැන ලියැවුණු තවත් නම් සිනමා ගීතයක් නොමැති බව මගේ හැඟීමයි. එමෙන්ම යසඉසුරු චිත්‍රපයේ අම්මාවරුනේ ගීතය තරම් හද කලඹන තවත් මවුන් ගැන ලියැවුණු තවත් සිනමා ගීතයක් මෙතුවක් කලකට බිහිවී ඇතිද?

මේ එතුමාගේ සිනමා ගීත පෙළහරයි. එපමණක්ද එතුමන් ලියූ බනින්නෙපා පොඩි දෝණිට, පුංචි පුතා මගෙ ඉස්කෝලේ ගිය, හද විල කලඹන පෙම් ජල රේඛා සහ අද දීගෙක ගිය නුඹ මට බුලත් අතක් දීලා වැනි සරල ගීත අපේ දිවියේම කොටස් මෙන් අපට සමීප විය. ඒ ගීත අසා අප හැඬුවෙමු. නැළවුණෙමු. නිවුණෙමු.

ගේය පද රචනය පමණක්ද? එතුමා මාධ්‍යවේදියෙකු, ලේඛකයකු හා අති දක්ෂ සිනමා තිරපිටපත් රචකයකුද විය. අමර□ය සිනමාපට වූ එයා දැන් ලොකු ළමයෙක් , සිරිපාල සහ රංමැණිකා සහ සරුංගලේ යන චිත්‍රපට පෝෂණය වූයේ එතුමාගේ තිර රචනයෙනි. ඒවායේ තිබූ කිසිදා අපට අමතක නොවන දෙබස් එතුමාගේය. ඒ වචන එතුමාගේය.

එතුමා ආදරයේ උච්චතම අවස්ථාවක් ආදරයේ රන් විමනේ මැණික් සඳක් පායලා යැයි ලියා අපගේ හද ගැබටම ඇමතීය. සැබෑ ප්‍රේමයක් ඇතිනම් එහිදී ඇතිවන විරහවේදී වුවද උපදින බෝසත් සිතිවිලි ගැන ලියූවේ මෙසේය.

ආල වඩන අකුරු පහේ තේරවිල්ල සකී...
රෑට නිදන තනි පැදුරේ නැති
සිහිනෙකි සකී....
ආලෙ බිඳුණ දා කුමකට කඳුළු
හෙළනු සකී....
ආල වඩන යන තේරුම බෝසත් කම සකී....
අම්මා ගැන ඔහු ලියූ මේ ලියවිල්ලට

20 වන පිටට